# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1995 අංක 37 දරන
# ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්ව විද්‍යාලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1995 දෙසැම්බර් මස 29 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 2.25

තැපැල් ගාස්තුව : රු. 2.55 යි.

## 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1995 දෙසැම්බර් මස 29 වන දින.]

එල්. ඩී.—ඕ. 51/95

**1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

*ලුහුඬු නාමය, සහ ක්‍රියාත්මක වන දිනය.*

1. මේ පනත 1995 අංක 37 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, මේ පනතේ විධිවිධාන සියල්ලම හෝ ඉන් යම් විධිවිධානයක් හෝ සම්බන්ධයෙන් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයක දී හෝ දිනවල දී ක්‍රියාත්මක වන්නේ ය.

*1981 අංක 74 දරන පනතේ 3 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.*

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1981 අංක 74 දරන ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය පනතේ 3 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :—

*"විශ්වවිද්‍යාලයේ අරමුණු.*

3. විශ්වවිද්‍යාලයේ අරමුණු පහත දැක්වෙන අරමුණු විය යුතු ය :—

(i) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි බුද්ධාගම පතුරුවාලීම සහ ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය සහ විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම ;

(ii) ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පාලි භාෂාව බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ දර්ශනය හැදෑරීම ප්‍රවර්ධනය කිරීම සහ වර්තමාන ලෝක තත්ත්වයන්ට ගැළපෙන පරිදි එම අධ්‍යයන නංවාලීම ;

(iii) (අ) පිරිවෙන්වල, පාසල්වල සහ ඒ හා සමාන ආයතනවල බුද්ධාගම හා පාලි භාෂාව ඉගැන්වීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ ගිහි පිරිමි ශිෂ්‍යයන් පුහුණු කිරීම ;

(ආ) ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා සහ සියලුම ගිහි පිරිමි ශිෂ්‍යයන් අතර ආචාර ධර්මානුකූල පැවැත්ම හා මානසික ශික්ෂණය පවත්වා ගෙන යාම සහ ඒවා වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ; සහ

(ඇ) ඉහත සඳහන් කාරණා කිසිවක් සම්බන්ධ හෝ ආනුෂංගික වෙනත් යම් කාරණා.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

විශ්වවිද්‍යාලයේ බලතල.

"4. මේ පනතේ විධිවිධානවලට යටත්ව, පහත සඳහන් බලතල විශ්වවිද්‍යාලයට ඇත්තේ ය :—

(i) විශ්වවිද්‍යාලයෙන් සැපයිය යුතු පාඨමාලා සහ විශ්වවිද්‍යාලය විසින් පිරිනැමිය යුතු උපාධි, අභිඥානපත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා තීරණය කිරීම ;

(ii) විශ්වවිද්‍යාලයට වාර්ෂිකව ඇතුළත් කර ගනු ලැබිය යුතු ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සහ ගිහි පිරිමි ශිෂ්‍යයන්ගේ මුළු සංඛ්‍යාව සහ ඒ ශිෂ්‍ය සංඛ්‍යාව විශ්වවිද්‍යාලයේ ඒ ඒ අධ්‍යයන පාඨමාලාවලට බෙදා හැරිය යුතු ආකාරය කලින් කල තීරණය කිරීම ;

(iii) කමිටුවේ සංයුතිය, බලතල, කාර්ය සහ කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබූ ප්‍රවේශ කමිටුවක් මගින්, විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ශිෂ්‍යයන් වශයෙන් ඇතුළු කර ගැනීම සඳහා ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා හා ගිහි පිරිමි ශිෂ්‍යයන් තෝරා ගැනීම සහ ඔවුන් විශ්වවිද්‍යාලයට ඇතුළු කර ගැනීම :

එසේ වුවද, වාර්ෂිකව ඇතුළු කර ගනු ලබන මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා විය යුතු ය.

(iv) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, කවර වුවද අනුමත අධ්‍යයන ක්ෂේත්‍රයක ඉගැන්වීම සඳහා විධිවිධාන සැලැස්වීම ;

(v) විවිධ අධ්‍යයන ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(vi) අනුමත කරන ලද පාඨමාලා විශ්වවිද්‍යාලයෙහි දී හදාරා නියෝග මගින් නියම කර ඇති විශ්වවිද්‍යාලීය විභාග සාමර්ථ්‍යය ලබා ඇති තැනැත්තන්ට උපාධි අභිඥාන පත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සහ පිරිනැමීම ;

(vii) ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට සහ විශ්වවිද්‍යාලය විසින් පිළිගනු ලැබූ විදේශීය ආයතන වල ශිෂ්‍යයන්ට, විශ්වවිද්‍යාලයේ උපාධි, අභිඥානපත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා බාහිර විභාග පැවැත්වීම ;

(viii) විශ්වවිද්‍යාලයේ බාහිර විභාගවලින් සාමාර්ථ්‍යය ලැබූ තැනැත්තන්ට උපාධි, අභිඥානපත්‍ර හා වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීම හා පිරිනැමීම ;

(ix) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් නිර්දේශ කරනු ලැබ විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අනුමත කරන ලද තැනැත්තන්ට සම්මාන උපාධි හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා හෝ පිරිනැමීම ;

(x) බෞද්ධ ධර්ම හා පාලි භාෂා අධ්‍යාපනය වැඩි දියුණු කිරීම සඳහා, පර්යේෂණ ශිෂ්‍යත්ව ඇති කොට ඒ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සහ සුදුසු පශ්චාත් උපාධි පර්යේෂණ ශිෂ්‍යයන්ට මුදලින් ආධාර කිරීම ;

(xi) මහාචාර්ය තනතුරු, සහාය මහාචාර්ය තනතුරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය තනතුරු, කථිකාචාර්ය තනතුරු හා විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා අවශ්‍ය වෙනත් තනතුරු ඇති කිරීම ;

(xii) මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, තෑග්ගකින්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් විශ්වවිද්‍යාලය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීම හා දැරීම සහ විශ්වවිද්‍යාලයේ නියෝග මගින් නියම කොට ඇති යම් කොන්දේසි, සීමාකිරීම් හා තහනම් කිරීම්වලට යටත්ව, ඒ දේපළ විකිණීම, පැවරීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් [illegible] දනය කිරීම ;

(xiii) විශ්වවිද්‍යාලයේ අරමුණුවලට සමාන හෝ සාරානුකූලව සමාන අරමුණු ඇති, ශ්‍රී ලංකාවෙහි හෝ විදේශයන්හි පිහි...

වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමඟ අචාර්යවරයන්, ශිෂ්‍යයන් හා ශාස්ත්‍රධර යන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ සහයෝගයෙන් ක්‍රියා කිරීම ;

(xiv) විශ්වවිද්‍යාලයේ කාර්ය සඳහා පුස්තකාල හා වෙනත් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා නඩත්තු කිරීම ;

(xv) විශ්වවිද්‍යාලයේ සියලුම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට ද ගිහි පිරිමි ශිෂ්‍යයන්ට ද අවශ්‍ය නේවාසිකාගාර පිහිටුවා පාලනය කිරීම, නේවාසික පහසුකම් සලස්වන වාසස්ථාන සඳහා බලපත්‍ර නිකුත් කිරීම සහ එම අයගේ වාසය පිණිස අවශ්‍ය වන වෙනත් එවැනි සේවා හා පහසුකම් සැලැස්වීම ;

(xvi) විශ්වවිද්‍යාලයේ ආචාර්යවරයන්ගේ, නිලධරයන්ගේ හා වෙනත් සේවානියුක්තයන්ගේ වාසය, විනය හා ශුභසිද්ධිය විධිමත් කිරීම සහ ඒ සඳහා විධිවිධාන සැලැස්වීම ;

(xvii) ණය මුදල් ලබාගැනීම සම්බන්ධයෙන් වූ නියෝගවලට අනුකූලව, විශ්වවිද්‍යාලයේ සියලුම ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාට සහ ගිහි පිරිමි ශිෂ්‍යයන්ට බැංකුවලින් සහ වෙනත් ආයතනවලින් ණය මුදල් ලබාගැනීමට ආධාර කිරීම ;

(xviii) නියෝග මගින් කලින් කල නියම කරනු ලබන ගාස්තු ඉල්ලා සිටීම හා ඒ ගාස්තු ලබාගැනීම ; සහ

(xix) මේ පනතෙහි දැක්වෙන බලතල කිසිවක් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා සහ 3 වන වගන්තියෙහි දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "4 වන වගන්තියේ (ඉ) ඡේදයේ විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ ද ශ්‍රී ලංකාවේ නිත්‍යානුකූලව වෙසෙන්නා වූ ද ස්ත්‍රී පුරුෂ" යන ඉලක්කම් සහ වචන වෙනුවට, "4 වන වගන්තියේ (vii) වන සහ (viii) වන ඡේදවල විධිවිධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ පුරවැසියන් වන්නා වූ හෝ නිත්‍යානුකූලව ශ්‍රී ලංකාවේ

පදිංචිය දරන්නා වූ පුරුෂ පක්ෂයේ" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 5අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"ශිෂ්‍යාවන්ගේ අයිතිවාසිකම්.

5අ. තත්කාර්ය සඳහා සාදනු ලබන නියෝගවලට යටත්ව, විශ්වවිද්‍යාලයේ බාහිර ශිෂ්‍යාවන් වශයෙන් විශ්වවිද්‍යාලයේ උපාධි සමත්වීමේ සහ උපාධි, අභිඥානපත්‍ර හෝ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ලබා ගැනීමේ හිමිකම ස්ත්‍රී පක්ෂයේ තැනැත්තන්ට ඇත්තේ ය. ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය ඉවත් කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(ඇ) ශ්‍රී ලංකා අමරපුර මහා සංඝ සභාවේ තත්කාලයේ සභාපති ධුරය හෝ උත්තරීතර මහානායක ධුරය දරන මහානායක හිමිපාණන් වහන්සේ ; සහ".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (i) වන ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(1) මහෝපාධ්‍යායයන් වහන්සේ ;";

(2) ඒ වගන්තියේ (i) වන ඡේදයට ඉක්බිතිව ම ඒ වගන්තියේ (ii) වන ඡේදය වශයෙන් බලපැවැත්වෙන පරිදි පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් :—

"(ii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;" සහ

(3) ඒ වගන්තියේ (ii), (iii), (iv) සහ (v) වන ඡේද පිළිවෙලින් ඒ වගන්තියේ (iii), (iv), (v) සහ (vi) වන ඡේද ලෙස නැවත අංක කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) (අ) විශ්වවිද්‍යාලයේ ප්‍රථම මහෝපාධ්‍යායයන් වහන්සේ ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන භික්ෂූන් වහන්සේ නමක් විය යුතු ය. සෑම තදනන්තර මහෝපාධ්‍යායයන් වහන්සේ නමක්ම, (ආ) සහ (ඇ) ඡේදවල විධිවිධානවලට යටත්ව, විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් නම් කරනු ලබන භික්ෂූන් වහන්සේලා තුන් නමකින් සමන්විත වන මූල මණ්ඩලයකින් අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය;

(ආ) කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූරකාල දෙකකට වැඩි ගණනකට විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් පත් කරනු නොලැබිය යුතු ය;

(ඇ) අමාත්‍යවරයා විමසා ජනාධිපතිවරයා විසින් විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේ ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය; තවද

(ඈ) ධූර කාලය ඉකුත් වීමෙන් හෝ ඉල්ලා අස් වීමෙන් හෝ ස්වකීය ධූරය හිස් කරන යම් මහෝපාධ්‍යායයන් වහන්සේ නමකට, නැවත මහෝපාධ්‍යායයන් වහන්සේ වශයෙන් පත් කරනු ලැබීමට පෙර දැරූ නිත්‍ය තනතුරට පෙරළා පත්වීමට අයිතිවාසිකම් ඇත්තේ.".

(2) ඒ වගන්තියේ (2), (3), (4), (5), (6), (7) සහ (8) වන උප වගන්තිවල "මහෝපාධ්‍යායයන් වහන්සේ" යන යෙදුම් යෙදී ඇති සෑම තැනකම ඒ වෙනුවට "මහෝපාධ්‍යායයන් වහන්සේ" යන යෙදුම ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අළුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(9) මහෝපාධ්‍යාය ධූරයේ යම් පුරප්පාඩුවක් ඇතිවුව හොත්, (1) (අ) වගන්තිය යටතේ ස්ථිර පත්වීමක් කරන තෙක්, ඒ ධූරයේ කාර්ය ඉටු කිරීම සඳහා සුදුසු යයි ලේකම්වරයා අදහස් කරන වැඩ පිළිවෙලක් ලේකම්වරයා විසින් යෙදිය යුතු ය.

(10) මේ පනතේ කුමක් සඳහන් වුව ද ඒ නොතකා, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධූරය දැරූ මහෝපාධ්‍යායයන් වහන්සේ එසේ ආරම්භ වන දින සිට එම ධූරය දැරීම නතර වන්නේ ය:

එසේ වුවද, ධූරය දැරීම එසේ නතර කරන මහෝපාධ්‍යායයන් වහන්සේ නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, "සෑම තදනන්තර ලේඛකාධිකාරිවරයකුම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය" යන වචන වෙනුවට "සෑම තදනන්තර ලේඛකාධිකාරිවරයකුම, රීතිවලින් නියම කරනු ලැබිය යුතු ආකාරයට සංයුක්ත වූ තේරීම් කමිටුවක නිර්දේශය මත, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, "සෑම තදනන්තර පුස්තකාලයාධිකාරිවරයකු ම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය" යන වචන වෙනුවට, "සෑම තදනන්තර පුස්තකාලයාධිකාරිවරයකු ම, රීතිවලින් නියම කරනු ලැබිය යුතු ආකාරයට සංයුක්ත වූ තේරීම් කමිටුවක නිර්දේශය මත පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ (1) වන උපවගන්තියේ, "සෑම තදනන්තර මූල්‍යාධිකාරිවරයකුම පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට, "සෑම තදනන්තර මූල්‍යාධිකාරිවරයකුම, රීතිවලින් නියම කරනු ලැබිය යුතු ආකාරයට සංයුක්ත වූ තේරීම් කමිටුවක නිර්දේශය මත, පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කිරීම.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය ඉවත් කිරීම.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල.

15. පහත දැක්වෙන බලමණ්ඩල විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල වන්නේ ය :—

(i) පාලක සභාව ;

(ii) සනාතන සභාව ;

(iii) පීඨ මණ්ඩලය හෝ පීඨ මණ්ඩල".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) මෙහි මින්මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන විශ්වවිද්‍යාලයේ පාලක සභාව, විශ්වවිද්‍යාලයේ විධායක මණ්ඩලය ද පාලන බල මණ්ඩලය ද වන්නේ ය. (vii) වන ඡේදයේ විධිවිධානවලට යටත්ව, එය පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත වන්නේ ය :-

(i) මහෝපාධ්‍යායයන් වහන්සේ ;

(ii) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(iii) සනාතන සභාව විසින් ස්වකීය සාමාජිකයන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(iv) බුද්ධ ශාසන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(v) උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ ලේකම්වරයාගේ නාමිකයා ;

(vi) ඉහත සඳහන් (i), (ii), (iii), (iv) සහ (v) වන ඡේද යටතේ පත් කරනු ලැබූ මුළු සාමාජික සංඛ්‍යාවට එකක් එකතු කළ විට ලැබෙන සංඛ්‍යාවට සමාන සාමාජික සංඛ්‍යාවක් ; (මෙහි මින්මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ සියලු සාමාජිකයන්, අධ්‍යාපන, මූල්‍ය, නීති සහ පරිපාලන ක්ෂේත්‍රවල විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය ;

(vii) පාලක සභාවේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් සියයට පනහකට නොඅඩු සංඛ්‍යාවක් භික්ෂූන් වහන්සේලා විය යුතු ය." ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "මහෝපාධ්‍යායයන් වහන්සේ" යන යෙදුම වෙනුවට "මහෝපාධ්‍යායයන් වහන්සේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ;

(3) ඒ වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් :—

"(3) පාලක සභාවේ පත් කළ සාමාජිකයකු හෝ තෝරා පත් කළ සාමාජිකයකු, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, කලින් සිය ධුරය හිස් කළහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඒ සාමාජිකයා පත් කරනු ලැබූ

හෝ තෝරා පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලැබිය යුතු වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඒ සාමාජිකයා ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුස්සෙක් වන්නේ ය :

එසේ වුවද, යම් තෝරා පත් කළ සාමාජිකයකු හෝ පත් කළ සාමාජිකයකු සිය ධුර කාලය අවසන් වීමට පෙර ධුරය හිස් කළහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා, තමාද කලින් තම ධුරය හිස් කරන්නේ නම් මිස, තම පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂවී ඇති කාලය තුළ එම ධුරය දැරිය යුතු ය.

(4) (අ) අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයා වෙත හෝ මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත යවනු ලබන තම අත්සන යටතේ වූ ලිපියක් මගින් පාලක සභාවේ කවර වුවද පත් කළ සාමාජිකයකුට හෝ තෝරා පත් කළ සාමාජිකයකුට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(ආ) මේ පනතේ කුමක් සඳහන්ව ඇත ද ඒ නොතකා, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී ධුර දැරූ පාලක සභාවේ පත් කළ සාමාජිකයන්, එසේ සාමාජිකයන් වශයෙන් ධුර දැරීම, මේ වගන්තිය ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ දී නතර වන්නේ ය :

එසේ වුව ද එසේ ධුර දැරීම නතර වන යම් පත් කළ සාමාජිකයෙක් නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.";

(5) ඒ වගන්තියේ (5) වන සහ (6) වන උපවගන්තිවල "ජනාධිපතිවරයා" යන යෙදුම වෙනුවට "අමාත්‍යවරයා" යන යෙදුම ආදේශ කිරීමෙන්.

**16.** ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ උපවගන්තියේ (vi) වන සහ (vii) වන ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(vi) විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ වාර්ෂික ගිණුම් සලකා බැලීම සහ අවශ්‍ය වේ නම් සංශෝධනය කර සම්මත කිරීම සහ ඒ වාර්තාව හා ගිණුම් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කිරීම ;

(vii) විශ්වවිද්‍යාලයේ බාහිර විභාග සඳහා අනුමත කරන ලද අධ්‍යයන පාඨමාලා සැපයීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත වූ ආයතන, අතුරු ව්‍යවස්ථා වලින් නියම කොට ඇති ආකාරයට, පිළිගැනීම සහ ලියාපදිංචි කිරීම.";

(2) ඒ වගන්තියේ (ix) වන සහ (x) වන ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් ;—

"(ix) (අ) විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයට අදාළ කළ යුතු බඳවා ගැනීමේ පරිපාටි සහ පත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටි, ශ්‍රී ලංකාවේ අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලවල ක්‍රියාත්මක වන බඳවා ගැනීමේ පරිපාටිවලට සහ පත් කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිවලට අනුරූප වන පරිදි සකස් කිරීම සහ, කාර්ය මණ්ඩලයේ විවිධ ශ්‍රේණි සහ ඒ එක් එක් ශ්‍රේණියට අයත් විය යුතු සංඛ්‍යාව කලින් කල නිශ්චය කිරීම ; සහ

(ආ) අනෙකුත් ජාතික විශ්වවිද්‍යාලවල සමස්ත වේතන සහ වැටුප් ප්‍රතිපත්ති තුළ පිහිටා විශ්වවිද්‍යාලයේ විවිධ ශ්‍රේණිවල කාර්ය මණ්ඩලයට ගෙවිය යුතු පාරිශ්‍රමික ප්‍රමාණ සහ ඒ කාර්ය මණ්ඩලයට ලැබිය යුතු වෙනත් ප්‍රතිලාභවල ස්වභාවය හා ප්‍රමාණය කලින් කල නිශ්චය කිරීම ;

(x) අතුරු ව්‍යවස්ථා, රීති සහ නියෝග සෑදීමට බලය දී ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා, රීති සහ නියෝග සෑදීම.";

(3) ඒ වගන්තියේ (xii) වන සහ (xiii) වන ඡේද වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කිරීමෙන් :—

"(xii) සනාතන සභාවේ නිර්දේශ සැලකිල්ලට ගෙන, විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙන් හෝ ඉන් බැහැරින් හෝ විභාග පරීක්ෂකවරයන් පත් කිරීම සහ එම විභාග පරීක්ෂකවරයන්ට ගෙවනු ලබන ගාස්තු නිශ්චය කිරීම ;

(xiii) විශ්වවිද්‍යාලයේ සේවය සඳහා තැනැත්තන් පත් කිරීම, ඔවුන්ගේ සේවය තාවකාලිකව නතර කිරීම, ඔවුන් සේවයෙන් පහ කිරීම හෝ වෙනත් ආකාරයකින් ඔවුන්ට දඬුවම් දීම :

එසේ වුවද, නිලධරයන් හා ආචාර්යවරයන් සම්බන්ධයෙන් වූ විට හැර, මේ බලතල මහෝපාධ්‍යායයන් වහන්සේ වෙත පවරනු ලැබිය හැකිය.";

(4) ඒ උපවගන්තියේ (xv) වන සහ (xvi) වන ඡේද ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන් :—

"(xv) විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන්ගේ සාමාන්‍ය ශුභ සිද්ධිය දියුණු කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයන් ඇතුළත් විය යුතු ශුභසාධක මණ්ඩලයක් පත් කිරීම, ඒ මණ්ඩලයේ සංයුතිය සහ බලතල, කාර්ය හා කර්තව්‍ය අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලැබිය යුතුය ; සහ

(xvi) ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මේ පනතින් අන්‍යාකාර විධිවිධාන සලස්වා නොමැති විශ්වවිද්‍යාලයේ අනිකුත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම :

එසේ වුවද, සනාතන සභාවේ මතය පාලක සභාව වෙත වාර්තා කිරීමේ හා යැවීමේ අවස්ථාවක් සනාතන සභාවට ප්‍රථමයෙන් දී ඇත්තේ නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් පාලක සභාව විසින් කිසිම යෝජනාවක් සම්මත නොකළ යුතු ය.

මේ වගන්තියෙහි "අධ්‍යයන කාරණය" යන්නෙන් සනාතන සභාවේ පාලනයට හා සාමාන්‍ය විධානයට යටත් කවර වුවද කාරණයක් අදහස් වේ.".

**17.** ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියේ 18අ, 18ආ, 18ඇ, 18ඈ, 18ඉ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය :— 18, 18ආ, 18ඇ 18ඈ සහ 18ඉ අලුත් වගන්ති ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කිරීම.

"සනාතන සභාව.

18අ. (1) විශ්වවිද්‍යාලයට සනාතන සභාවක් තිබිය යුතු අතර, එය විශ්වවිද්‍යාලයේ අධ්‍යයන බලමණ්ඩලය වන්නේ ය.

(2) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය :—

(අ) මහෝපාධ්‍යායයන් වහන්සේ ;

(ආ) එක් එක් පීඨයේ පීඨාධිපතිවරයා ;

(ඇ) එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානයා ;

(ඈ) පුස්තකාලයාධිකාරීවරයා ;

(ඉ) විශ්වවිද්‍යාලයේ සෑම ස්ථිර මහාචාර්යවරයෙක් ;

(ඊ) එක් එක් පීඨයේ ස්ථිර ආචාර්යවරයන් විසින්, තමන් අතුරින් තෝරා පත් කර ගත යුතු වූ ද මෙහි ඉහත සඳහන් ඡේදවල සඳහන් ආචාර්යවරයන් නොවන්නා වූ ද ආචාර්යවරයන් දෙදෙනෙක්; සහ

(උ) ශ්‍රී ලංකාවේ අනෙකුත් විශ්ව විද්‍යාලවල බෞද්ධ අධ්‍යයන සහ සංස්කෘතික අධ්‍යයන අංශවල මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතුරෙන් පාලක සභාව විසින් පත් කරනු ලබන ආචාර්යවරු පස්දෙනෙක්.

(3) අවස්ථාවෝචිත පරිදි, සෑම තෝරා පත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ හෝ සාමාජිකයකු විසින්, තමා තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ හෝ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය:

එසේ වුවද, පත් කරනු ලැබූ හෝ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයකු විශ්‍රාම යාම හෝ ඉල්ලා අස්වීම හෝ සනාතන සභාවේ අනුගාමී රැස්වීම් තුනකට නොපැමිණීම හෝ හේතුකොටගෙන අන්‍යාකාරයකින් ධුරය හිස් කරන අවස්ථාවක, (2) වන උපවගන්තියේ (ඊ) සහ (උ) ඡේදවල විධිවිධානවලට අනුකූලව, ඔහු වෙනුවට වෙනත් සාමාජිකයකු, අවස්ථාවෝචිත පරිදි, පත් කරගනු හෝ තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. තවද ඒ සාමාජිකයා ද කලින් ධුරය අත්හැරිය හොත් මිස, ස්වකීය පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ශේෂ වී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

(4) සනාතන සභාවේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය මුළු සාමාජික සංඛ්‍යාවෙන් සතරෙන් එකක් විය යුතු ය.

(5) විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම, අධ්‍යාපනය, පර්යේෂණ සහ විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය සනාතන සභාව සතු වන්නේ ය.

(6) මේ පනතෙහි විධිවිධානවලට යටත්ව හා (5) වන උපවගන්තියේ සනාතන සභාව වෙත පැවරුණු බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, සනාතන සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය:—

(ඉ) අදාළ පීඨයෙහි හෝ පීඨවල හෝ වාර්තා සලකා බැලීමෙන් පසු, පාලක සභාවේ එකඟත්වය ඇතිව අධ්‍යයන පාඨමාලාවලට හා විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කිරීම ;

(ඊ) අදාළ පීඨයෙහි හෝ පීඨවල වාර්තා, සලකා බැලීමෙන් පසු විභාග පරීක්ෂකයන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන්ගේ නම් පාලක සභාව වෙත නිර්දේශ කිරීම ;

(උ) විශ්වවිද්‍යාලයේ මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කථිකාචාර්ය හා වෙනත් අධ්‍යයන තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ අත්හිටුවීම හෝ සම්බන්ධයෙන් පාලක සභාවට නිර්දේශ කිරීම ;

(ඌ) අදාළ පීඨයෙහි හෝ පීඨවල වාර්තා, සලකා බැලීමෙන් පසු—

(i) පවත්නා පීඨ හා අධ්‍යයන අංශ ප්‍රතිසංවිධානය කිරීම සඳහා සහ අලුත් පීඨ හා අධ්‍යයන අංශ සංවිධානය කිරීම සඳහා වූ යෝජනාක්‍රම පාලක සභාවට නිර්දේශ කිරීම ; සහ

(ii) අධ්‍යයන විෂයයන් අදාළ පීඨවලට පැවරීම පිළිබඳව පාලක සභාවට නිර්දේශ කිරීම ;

(එ) සනාතන සභාවට සුදුසු යයි පෙනී යන පරිදි, සනාතන සභාවේ ස්ථාවර කමිටු, තත්කාර්ය කමිටු හෝ මණ්ඩල සංඛ්‍යාවක් සහ විශේෂයෙන්, එහෙත් මේ උප වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට හානියක් නොමැතිව—

(i) පුස්තකාල කමිටුවක් ;

(ii) පර්යේෂණ කමිටුවක්;

(iii) විෂය මාලා හා ඇගයීම් කමිටුවක් ; සහ

(iv) ආධුනික අධ්‍යයන නිවාඩු කමිටුවක් පත් කිරීම හා ඒ කමිටුවල විෂය කරුණු නියම කිරීම සහ ඒ කමිටු වාර්තා සලකා බැලීම හා ඉවතක් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම

පීඨ මණ්ඩල.

18ඇ. (1) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨයකට, පහත දැක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු පීඨ මණ්ඩලයක් තිබිය යුතු ය :—

(අ) ඒ පීඨයේ පීඨාධිපතිවරයා ;

(ආ) පීඨය සංයුක්ත වන අධ්‍යයන අංශවලට අයත් වන සියලුම ස්ථිර මහාචාර්යවරයන්, සහාය මහාචාර්යවරයන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයන් සහ කථිකාචාර්යවරයන් ;

(ඇ) පීඨයේ ස්ථිර සහකාර කථිකාචාර්යවරයන් විසින් තමන් අතුරින් තෝරා පත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඈ) ඉහත (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් තැනැත්තන් හැර, පීඨයේ ඉගැන්වීමේ කාර්යයෙහි යෙදී සිටින ස්ථිර කාර්ය මණ්ඩලය විසින් තමන් අතුරින් තෝරා පත් කර ගන්නා සාමාජිකයන් දෙදෙනෙක් ;

(ඉ) පීඨයේ ශිෂ්‍යයන් විසින් තමන් අතුරින් තෝරා පත්කර ගන්නා ශිෂ්‍යයන් දෙදෙනෙක් ; සහ

(ඊ) පීඨයට අදාළ අධ්‍යයන ක්ෂේත්‍රවල විශේෂඥත්වයක් දරන්නා වූ ද විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලයෙහි සාමාජිකයන් නොවන්නා වූ ද තැනැත්තන් අතුරින් පීඨ මණ්ඩලය විසින් තෝරා පත් කර ගන්නා තැනැත්තන් තිදෙනෙක්.

(2) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයකු එසේ තෝරා පත් කර ගනු ලැබූ දින සිට ගණන් බලනු ලබන එක් අවුරුදු කාලයක් පමණක් සාමාජිකයකු වශයෙන් ධුරය දැරිය යුතු අතර තෝරා පත්කර ගනු ලැබූ සෙසු යම් සාමාජිකයෙක්, ඔහු තෝරා පත්කර ගනු ලැබූ දින සිට ගණන් බලනු ලබන අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු ය. ඒ හැම සාමාජිකයෙක්ම නැවත තෝරා පත් කර ගනු ලැබීම සඳහා සුදුස්සෙක් වන්නේ ය.

(3) මේ පනතේ විධිවිධානවලට යටත්ව, පීඨ මණ්ඩලයක් විසින් පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම කළ යුතු ය :—

(අ) සනාතන සභාව විසින් පීඨය වෙත යොමු කරනු ලබන යම් කාරණයක් සලකා බැලීම හා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීම ;

(ආ) සනාතන සභාවේ පාලනයට යටත්ව, පීඨයේ අධ්‍යයන අංශවල ඉගැන්වීම සහ විභාග හා පර්යේෂණ කටයුතු හා සම්බන්ධ කරුණු විධිමත් කිරීම ;

(ඇ) විශේෂ විෂයයක් හෝ විෂයයන් හෝ සලකා බලා ඒ සම්බන්ධයෙන් වාර්තා කිරීමේ කාර්යය සඳහා, පීඨයේ සාමාජිකයන් නොවන තැනැත්තන් ද ඇතුළත් විය හැකි කමිටු පත් කිරීම ;

(ඈ) පීඨයේ අධ්‍යයන පාඨමාලා සහ විභාග හා සම්බන්ධ සියලු කාරණා පිළිබඳව සනාතන සභාවට නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම ; සහ

(ඉ) විභාග පරීක්ෂකයන් වශයෙන් පත් කිරීමට සුදුසු තැනැත්තන් සනාතන සභාව වෙත නිර්දේශ කිරීම.

(4) (අ) පීඨ මණ්ඩලයේ සෑම රැස්වීමකම මූලසුන පීඨාධිපති විසින් දැරිය යුතු ය ;

(ආ) මේ පනතේ 18ඇ වගන්තිය යටතේ පීඨාධිපතිවරයකු තෝරා පත් කර ගැනීමට හා විභාගවලට සහ ඒ හා සම්බන්ධ කරුණුවලට අදාළ වූ පීඨ මණ්ඩලයේ යම් රැස්වීමක කටයුතුවලින්, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ තෝරා පත්කර ගනු ලැබූ සාමාජිකයන් බැහැර කරනු ලැබිය යුතු අතර, එවැනි යම් රැස්වීමක්, එවැනි බැහැර කිරීමක් නොතකා, යථා පරිදි පවත් වනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය.

පීඨාධිපතිවරු.

18ඇ. (1) එක් එක් පීඨය සඳහා පීඨාධිපතිවරයකු සිටිය යුතු අතර, ඔහු විශ්වවිද්‍යාලයේ පූර්ණ කාල නිලධරයකු ද පීඨයෙහි, ශාස්ත්‍රීය හා පරිපාලන ප්‍රධානයා ද විය යුතු ය. පීඨයක් සමන්විත වන අධ්‍යයන අංශවල ප්‍රධානයන් අතුරින් ඒ පීඨයේ පීඨ මණ්ඩලය විසින් පීඨාධිපතිවරයා තෝරා පත් කළ යුතු අතර, එසේ තෝරා පත් කර ගනු ලැබූ විට ඔහු ඒ අදාළ අධ්‍යයන අංශයේ ප්‍රධානයා ව සිටීම අවසන් වන්නේ ය.

(2) පීඨාධිපතිවරයා, යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත් ව, ඔහු තෝරා පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත තෝරා පත් කරනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

(3) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට පීඨාධිපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත්, ඒ කාලය තුළ ඒ ධුරයේ කටයුතු කිරීමට මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඒ පීඨයේ වෙනත් යම් අධ්‍යයන අංශ ප්‍රධානයකු පත් කළ යුතු ය:

එසේ වුවද, පීඨාධිපතිවරයකු විශ්‍රාම ගන්නා විට හෝ ඉල්ලා අස්වන විට හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට, ඒ පීඨයේ පීඨාධිපති ධුරය පුරප්පාඩු වූ ලෙස සැලකිය යුතු අතර මේ වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව නව පීඨාධිපතිවරයකු තෝරා පත් කළ යුතු ය.

අංශ ප්‍රධානීන්

18ඈ. (1) මහෝපාධ්‍යායයන් වහන්සේගේ නිර්දේශය පිට, පාලක සභාව විසින් පත් කරනු ලබන මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක් හෝ කථිකාචාර්යවරයෙක් අධ්‍යයන අංශයක ප්‍රධානයා වන්නේ ය:

එසේ වුවද, පාලක සභාව විසින් අධ්‍යයන අංශයක ප්‍රධානයා පත් කරනු නොලැබූ අවස්ථාවක, පත් කරනු ලැබූ දින සිට ගණන් බලන ලද මාස එකකට නොවැඩි කාලයක් අංශ ප්‍රධානයාගේ තනතුරෙහි වැඩ බැලීම පිණිස මහෝපාධ්‍යායයන් වහන්සේ විසින්, මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු හෝ කථිකාචාර්යවරයකු පත් කරනු ලැබිය හැකි ය.

(2) අධ්‍යයන අංශයක ප්‍රධානයා කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, යම් උචිත සාධක පත්‍රයක විධිවිධානවලට යටත්ව, ඔහු පත් කරනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර නැවත පත් කරනු ලැබීමට ඔහු සුදුසු කෙනෙක් වන්නේ ය.

(3) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් හේතුවක් නිසා මාස තුනකට නොවැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට අධ්‍යයන අංශයක ප්‍රධානයාට තාවකාලිකව නොහැකි වුවහොත් ඒ කාලය තුළ ඒ ධුරයේ කටයුතු කිරීමට මහෝපාධ්‍යායතුමා විසින් ඒ අධ්‍යයන අංශයේ වෙනත් මහාචාර්යවරයකු, සහාය මහාචාර්යවරයකු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු හෝ කථිකාචාර්යවරයකු පත් කළ යුතු ය. එසේ වුවද, අධ්‍යයන අංශයක ප්‍රධානයකු විශ්‍රාම යෑම හෝ ඉල්ලා අස්වීම හෝ වෙනත් යම් හේතුවක් නිසා මාස තුනකට වැඩි කාලයක් තම ධුරයේ කටයුතු කිරීමට ඔහුට නොහැකි වූ විට අධ්‍යයන අංශ ප්‍රධානයාගේ ධුරය පුරප්පාඩු වූ ලෙස සැලකිය යුතු අතර (1) වන උප වගන්තිය අනුව අධ්‍යයන අංශයේ නව ප්‍රධානයකු පත් කළ යුතු ය.

පීඨ සහ අධ්‍යයන අංශ ඇති කිරීම.

18ඈ. විශ්වවිද්‍යාලයේ අරමුණු මුදුන් පමුණුවා ගැනීම අරභයා, එනි ඉගැන්වීම, පර්යේෂණ සහ ව්‍යාප්ති වැඩ සටහන් සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යයි පාලක සභාව විසින් සලකනු ලබන යම් පීඨයක් හෝ අධ්‍යයන අංශයක්, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පාලක සභාව විසින් කලින් කල පිහිටුවනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තියෙහි "නියෝගය" යන වචනය සඳහන් වන කවර වුවද තැනක ඒ වෙනුවට " රීතිය " යන වචනය ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ, (2) වන උපවගන්තියේ (ii) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ii) රීති මගින් නියම කොට ඇති පරිදි, ආචාර්ය තනතුරුවලට හෝ වෙනත් තනතුරුවලට හෝ පත් කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 21, 22 සහ 23 වන වගන්ති ප්‍රතිස්ථාපනය කිරීම.

**19.** ප්‍රධාන ප්‍රඥප්තියේ 21, 22 සහ 23 වන වගන්ති ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ආදේශ කරනු ලැබේ :—

"ආචාර්යවරයන්ගේ පරිවාස කාල පරිච්ඡේදය.

21. ආචාර්ය තනතුරකට කරනු ලබන සෑම පත් කිරීමක් ම, ප්‍රථම අවස්ථාවේ දී වර්ෂ තුනක පරිවාස කාලයක් සඳහා විය යුතු අතර, එක් අවස්ථාවක දී එක් වර්ෂය බැගින් වර්ෂ පහක් නොඉක්මවන වැඩිදුර කාලයකට විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් ඒ පරිවාස කාලය දීර්ඝ කරනු ලැබිය හැකි ය.

ආචාර්යවරයන් විශ්‍රාම යා යුතු වයස.

22. තම තනතුරේ ස්ථිර කරනු ලැබ සිටින ආචාර්යවරයකු වයස අවුරුදු හැටපහ සම්පූර්ණ කරන තෙක් හෝ යම් අධ්‍යයන වර්ෂයක් තුළ දී ඔහුගේ හැටපස්වන විය සම්පූර්ණ වන අවස්ථාවක දී ඒ අධ්‍යයන වර්ෂයේ අවසාන දිනය තෙක් හෝ ඔහු ඒ තනතුර දිගටම දැරිය යුතු අතර ඉන්පසු ඔහු සේවයෙන් විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම පිළිබඳව පාලක සභාව විසින් පරීක්ෂණයක් පවත්වන තුරු කවර වුවද වේලාවක එවැනි යම් ආචාර්යවරයකුගේ සේවය මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අත්හිටුවනු ලැබිය හැකි ය. නැතහොත්, එවැනි පරීක්ෂණය කින් පසු ඔහු වරදකරු කරනු ලැබුවහොත්, පාලක සභාව විසින් සම්මත කරනු ලබන යෝජනාවක් මගින් ඔහු සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්ය යෙන් විශ්‍රාම ගැන්වීම කරනු ලැබිය හැකි ය.

පරිවාස කාලපරිච්ඡේදයෙන් පසු සේවය ස්ථිර කිරීම.

23. ආචාර්ය තනතුරක් නොවන තනතුරකට කරනු ලබන සෑම පත්කිරීමක්ම, ප්‍රථම අවස්ථාවේ දී වර්ෂ තුනක පරිවාස කාලයක් සඳහා විය යුතු අතර, ඒ පත්කිරීම විශ්වවිද්‍යාලයේ ආචාර්ය තනතුරක් නොවන, තනතුරකින් ආචාර්ය තනතුරක් නොවන වෙනත් තනතුරකට උසස් කිරීමේ හේතුවෙන් කරන ලද පත් කිරීමක් වන අවස්ථාවක දී හැර, පාලක සභාව විසින් ස්ථිර කරනු ලැබීමට යටත් වන්නේය :

එසේ වුවද, විශ්වවිද්‍යාලයේ ආචාර්ය තනතුරක් නොවන තනතුරක තම පත්වීම ස්ථිර කරනු ලැබ ඇති යම් තැනැත්තකු ඉන්පසුව, උසස් කරනු ලැබීමෙන් හැර. විශ්වවිද්‍යාලයේ ආචාර්ය තනතුරක් නොවන වෙනත් තනතුරකට පත්කරනු ලබන අවස්ථාවකදී, ඔහුගේ ඒ පසුව කරනු ලැබූ පත්වීම,

ප්‍රථම අවස්ථාවේ එක් වර්ෂයක පරිවාස කාලයකට විය යුතු අතර, ඉන්පසු එම පත්වීම පාලක සභාව විසින් ස්ථිර කරනු ලැබීමට යටත් වන්නේ ය.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 23 අ අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ ඇතුළත් කිරීම.

" විශ්‍රාම ගැනීමේ වයස ආදිය.

23අ. ආචාර්ය තනතුරක් නොවන තනතුරක් දරන්නකුට වයස අවුරුදු පනස්පහ සම්පූර්ණ කරන තුරු තම ධුරයෙහි සිටිය හැකි අතර, ඉන්පසු ඔහු ස්වේච්ඡාවෙන් සේවයෙන් විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද, එවැනි යම් තනතුරක් දරන්නකු විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින්, ඔහුට වයස අවුරුදු හැට සම්පූර්ණ වන තුරු එක් වරකට එක් වර්ෂය බැගින් ඔහුගේ සේවය දීර්ඝ කළ හැකි අතර, ඉන් පසු ඔහු විශ්‍රාම ගත් ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේම තවදුරටත්, විෂමාචාරය, අකාර්යක්ෂමතාව හෝ කාර්ය පැහැර හැරීම පිළිබඳව පාලක සභාව විසින් පරීක්ෂණයක් පවත්වන තුරු කවර වේලාවක වුවද යම් තනතුරක් දරන්නකුගේ සේවය මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් අත්හිටුවිය හැකි ය; නැතහොත් එවැනි පරීක්ෂණයකින් පසු ඔහු වැරදිකරු කරනු ලැබුව හොත් පාලක සභාව විසින් සම්මත කරනු ලබන යෝජනාවක් මගින් ඔහු සේවයෙන් පහ කිරීම හෝ අනිවාර්යයෙන් විශ්‍රාම ගැන්වීම හෝ කළ හැකි ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 29 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

" (2අ) (අ) අර්ථසාධක අරමුදලෙහි දායකයකු මියයාමෙන් පසු, අර්ථසාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමෙහි බැරට ඇති මුදල් ගෙවනු ලැබිය යුතු, මින් මතු මෙම වගන්තියේ "නම් කළ තැනැත්තා " යනුවෙන් සඳහන් කරනු ලබන, තැනැත්තකු දායකයා විසින් නම් කරනු ලැබිය හැකි ය.

(ආ) දායකයාගේ අන්තිම කැමති පත්‍රයෙහි පටිහැනිව කුමක් සඳහන්ව ඇතද (අ) ඡේදය යටතේ කරනු ලැබූ නම්කිරීමක් බලපවත්වන්නේය.

(ඇ) මෙහි (අ) ඡේදය යටතේ කරනු ලැබූ නම්කිරීමක්, දායකයාගේ ජීවිත කාලය තුළ දී නම් කළ තැනැත්තා මියයාමෙන් හෝ දායකයාගේ අත්සන සහතික කරන සාක්ෂිකරුවකු ඉදිරිපිට දී දායකයා විසින් අත්සන් කරනු ලැබූ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ ලිඛිත දැන්වීමක් මගින් හෝ දායකයකු විසින් තදනන්තරව කරනු ලබන යම් නම්කිරීමක් මගින් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ සේ සැලකිය යුතු ය.

(ඈ) නම්කළ තැනැත්තා විසින් ඔහුගේ අනන්‍යතාව පිළිබඳව විශ්වවිද්‍යාල මූල්‍යාධිකාරිවරයා සෑහීමට පත්කළ හොත් මිස, අර්ථසාධක අරමුදලෙහි දායකයකුගේ ගිණුමේ බැරට ඇති කිසිම මුදලක් ඒ දායකයාගේ යම් නම්කළ තැනැත්තකුට ගෙවනු නොලැබිය යුතු ය.

(ඉ) අර්ථසාධක අරමුදලෙහි දායකයකුගේ ගිණුමේ බැරට ඇති යම් මුදලක්, ඒ දායකයා මියයාමෙන් පසු ඒ දායකයාගේ නම්කළ තැනැත්තාට භාරදීම, ඒ මුදල් සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ බැඳීම් මුළුමනින්ම ඉටු කිරීමක් වන්නේය."; සහ

(ඊ) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් උප වගන්තිය මෙයින් ආදේශ කිරීමෙන් :—

"(4) දායකයකු විශ්වවිද්‍යාලයෙහි සේවයෙහි නියුක්තව සිටිය දී මියගිය අවස්ථාවක, අර්ථසාධක අරමුදලේ ඒ දායකයාගේ ගිණුමෙහි බැරට තිබෙන සම්පූර්ණ මුදල, ඒ මුදලට එකතු වී ඇති පොලිය ද සමග (2අ) උපවගන්තිය යටතේ නම් කරන ලද තැනැත්තාට හෝ තැනැත්තන්ට හෝ, එසේ වලංගු නම්කිරීමක් කර නොමැති නම් ඒ මුදලට නීත්‍යානුකූල හිමිකමක් ඇති තැනැත්තාට හෝ තැනැත්තන්ට, 30 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව මූල්‍යාධිකාරිවරයා විසින් ගෙවිය යුතු ය.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ :- ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

"අර්ථසාධක අරමුදලින් කරනු ලබන ගෙවීම්වලින් අඩුකරගැනීම.

30. මේ කොටසේ පෙරාතුව වූ විධිවිධානවල කුමක් සඳහන් ව ඇතද ඒ නොතකා සහ වෙනත් යම් අයිතිවාසිකමකට හෝ ප්‍රතිකර්මයකට හානියකින් තොරව,—

(අ) දායකයකු විශ්වවිද්‍යාලයේ සේවයේ යොදවා සිටි කාලය තුළ කවර වුවද අවස්ථාවක ඔහුගේ වංචනිකභාවය හෝ නොසැලකිල්ල හේතුකොටගෙන විශ්වවිද්‍යාලයට දරන්නට සිදු වූ යම් පාඩුවක හෝ හානියක ප්‍රමාණය ;

(ආ) අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයෙන් හෝ ආණ්ඩුවෙන් හෝ දායකයා විසින් ලබා ගෙන ඇති යම් ණය මුදලක් වෙනුවෙන් කළ යුතු ගෙවීම් ; සහ

(ඇ) දායකයා විසින් ලියා අත්සන් කරන ලද යම් බැඳුම්කරයක්, ගිවිසුමක් හෝ වෙනත් සාධන පත්‍රයක් යටතේ අය විය යුතුව ඇත්තා වූ ද එසේ අයවිය යුතු මුදල් ඔහුගේ බැරට අර්ථසාධක අරමුදලේ ඇති මුදලින් ගෙවිය යුතු බවට එකී බැඳුම්කරයේ, ගිවිසුමේ හෝ සාධන පත්‍රයේ විධිවිධාන යටතේ දායකයා එකඟ වී ඇත්තා වූ ද අය කිරීම්

ඒ දායකයාගේ බැරට අර්ථසාධක අරමුදලේ ඇති මුදල් ප්‍රමාණයෙන් ගෙවිය යුතු ප්‍රථම වියදම් බරක් විය යුතු අතර, එවැනි මුදල් ප්‍රමාණ, ගෙවීම් සහ අය කිරීම්, 29 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව යම් ගෙවීමක් කරන විට අඩු කර ගනු ලැබිය හැකි ය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන කොටසට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස් මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, ඒ කොටස් ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ වන කොටස සහ VIIආ වන කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය :— VIIඅ සහ VIIආ අලුත් කොටස් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"VIIඅ වන කොටස

**විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමය සහ වෙනත් සමිති**

ශිෂ්‍ය සංගම් ආදිය.

39අ. (1) (i) විශ්වවිද්‍යාලය සඳහා විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයක් තිබිය යුතු ය.

(ii) විශ්වවිද්‍යාලයේ එක් එක් පීඨය සඳහා පීඨ ශිෂ්‍ය සංගමයක් තිබිය යුතු ය.

(iii) ඉහත ඡේදවල සඳහන් සංගම්වල නිලධරයන් තෝරා පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පැවැත්විය යුතු ආකාරය සහ ඒ නිලධරයන්ගේ කාර්ය හා කර්තව්‍ය, නියෝග මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) (i) විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රීය හෝ සාමාජීය අරමුණු මුදුන් පමුණුවා ගැනීමේ හුදු කාර්යය සඳහාම පිහිටුවනු ලැබුවා වූ යම් ශිෂ්‍ය සංගමයක් සමිතියක් හෝ වෙනත් සමාජයක් පාලක සභාව විසින් පිළිගනු ලැබිය හැකි ය. එසේ වුවද එවැනි ශිෂ්‍ය සංගමයක, සමිතියක හෝ වෙනත් සමාජයක සාමාජිකත්වය විශ්ව විද්‍යාලයේ ශිෂ්‍යයන්ට පමණක් සීමා විය යුතු ය.

(ii) (i) වන ඡේදය යටතේ පිළිගනු ලැබූ සංගම්, සමිති හෝ වෙනත් සමාජ ලියා පදිංචි කළ යුතු ආකාරය, ඒවායේ කර්තව්‍ය, ඒවායේ නිලධරයන් පත් කර ගැනීම සඳහා ඡන්ද විමසීම් පැවැත්විය යුතු ආකාරය සහ ඒ නිලධරයන්ගේ කාර්ය හා කර්තව්‍ය, පාලක සභාව විසින්, නියෝග මගින් නියම කළ හැකි ය.

(3) විශ්වවිද්‍යාල ශිෂ්‍ය සංගමයක, පීඨ ශිෂ්‍ය සංගම්වල සහ (1) වන සහ (2) වන උපවගන්ති යටතේ පාලක සභාව විසින් පිළිගනු ලැබූ යම් සංගමයක, සමිතියක හෝ වෙනත් සමාජයක, අනුමත කරන ලද කටයුතුවලට අවශ්‍ය යයි පාලක සභාව විසින් සලකනු ලබන මුදල් පාලක සභාව විසින්, කලින් කල වෙන්කර දෙනු ලැබිය හැකි ය.

(4) විශ්වවිද්‍යාලයේ යම් සංගමයක්, සමිතියක් හෝ වෙනත් සමාජයක් විශ්ව විද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ මතය අනුව, විශ්ව විද්‍යාලයේ හොඳ නමට අහිතකර හෝ හානිකර

අයුරින් ක්‍රියා කරනහොත් හෝ විශ්වවිද්‍යාලයේ නිසි පාලනයට අවහිර කරනහොත් හෝ මේ පනතට නැතහොත් යම් උචිත සාධන පත්‍රයකට පටහැනිව ක්‍රියා කරනහොත්, මහෝපාධ්‍යායයන් වහන්සේ විසින් ඒ සංගමය, සමිතිය හෝ වෙනත් සමාජය හෝ තාවකාලිකව තහනම් කිරීම හෝ විසුරුවා හැරීම හෝ කළ හැකි ය.

## VIIආ වන කොටස

### අමාත්‍යවරයා සතු බලතල

අමාත්‍යවරයා සතු බලතල ආදිය.

39ආ. (1) අමාත්‍යවරයා සතු වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට ඔහුට හැකිවන පරිදි, මුදල්, ශිෂ්‍යයන් සඳහා වෙන් කරනු ලබන ස්ථාන සංඛ්‍යාව හා ඉගැන්වීමේ මාධ්‍යය යනාදි කාරණා පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය අනුව අවශ්‍ය යයි ඔහු සලකන සාමාන්‍ය ලිඛිත විධාන පාලක සභාව වෙත කලින් කල නිකුත් කිරීම අමාත්‍යවරයා විසින් කළ හැකි ය. ඒ සෑම විධානයක්ම හැකිතාක් ඉක්මනින් පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු ය.

(2) (අ) මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා නිශ්චිත බලධරයා වශයෙන් නමින් හෝ ධුරයෙන් හෝ යම් තැනැත්තකු ගැසට් පත්‍රයෙහි පළකරන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(ආ) නිශ්චිත බලධරයා විසින් තීරණය කරනු ලබන සාමාජිකයන් යම් සංඛ්‍යාවකගෙන් සමන්විත ස්ථාවර කාරක සභා වෙත හෝ තත්කාර්ය කාරක සභා වෙත නැතහොත් ඒ බලධරයා විසින් පත් කරනු ලබන යම් නිලධරයකු හෝ සේවකයකු හෝ වෙත, ස්වකීය බලතල කිසිවක්, අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව, නිශ්චිත බලධරයා විසින් පවරනු ලැබිය හැකිය. තවද

(ඇ) අමාත්‍යවරයා සතු වගකීම් ඵලදායී ලෙස ඉටු කිරීමට ඔහුට හැකිවන පරිදි, විශ්වවිද්‍යාලයේ කටයුතු සියල්ල හෝ ඉන් යම් කටයුත්තක් හෝ එහි පරිපාලනය හෝ විමර්ශනය කොට වාර්තා කරන ලෙස අමාත්‍යවරයා විසින් නිශ්චිත බලධරයාට කලින් කල නියම කළ හැකි ය.

(3) විශ්වවිද්‍යාලයේ පවත්නා තත්ත්වය රාජ්‍ය ආරක්ෂාවට අනතුරුදායක බවට හෝ ජාතික ප්‍රතිපත්තියට පටහැනි හෝ හානිකර බවට අමාත්‍යවරයා හැඟීමට පත්වූ අවස්ථාවක ඒ තත්ත්වය පාලනය කිරීම සඳහා අවශ්‍ය යයි තමා සලකන සියලු පියවර ගැනීමට අමාත්‍යවරයා විසින් පාලක සභාවට විධාන කළ හැකි ය.

(4) යම් වර්ජනයක් හෝ වසාතැබීමක් හෝ වෙන යම් හේතුවක් හෝ නිසා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු හෝ පරිපාලනය බරපතල ලෙස අඩාල වී ඇති බවට සහ කටයුතු හා පරිපාලනය යථා තත්ත්වයට පත් කිරීමට විශ්වවිද්‍යාලයේ බලමණ්ඩල අපොහොසත් වී ඇති බවට අමාත්‍යවරයා හැඟීමට පත් වූ අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ කටයුතු යථා තත්ත්වයට පත්කරනු පිණිස අවශ්‍ය වන සියලු ක්‍රියා මාර්ග අමාත්‍යවරයා විසින් ගනු ලැබිය හැකි ය. විශ්වවිද්‍යාලයේ යථා තත්ත්වය නැවත ඇති කරනු ලබන තෙක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම් කාරණයක් හෝ පිළිබඳව අවශ්‍ය යයි ඔහු සලකන සියලු විධිවිධාන සැලැස්විය හැකි ය :—

(අ) විශ්වවිද්‍යාලය වසා තැබීම ;

(ආ) විශ්වවිද්‍යාලයේ යම් නිලධරයකු, බලමණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් වෙනුවට, මේ පනත හෝ යම් උචිත සාධන පත්‍රයක් හෝ යටතේ ඒ නිලධරයාට බල මණ්ඩලයට හෝ පුද්ගල මණ්ඩලයට පිරිනමා ඇති නියම කර ඇති හෝ පවරා දී ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා නිසි නිලධරයා වශයෙන් යම් තැනැත්තකු නමින් හෝ නිලයෙන් හෝ පත්කිරීම ; සහ

(ඇ) ඉහත සඳහන් කාරණාවලට සම්බන්ධ හෝ අදාළ වන වෙනත් යම් කාරණයක්

(5) අමාත්‍යවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ නියමයක්, එහි සඳහන් දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය. ඉන් පසු හැකි තාක් ඉක්මණින් එකී නියමය පාර්ලිමේන්තුව ඉදිරියේ සභාගත කළ යුතු අතර, කලින් පරිච්ඡින්න කරනු ලැබුවහොත් මිස, එය ඉන් පසු, මාස තුනක් නොඉක්මවන කාලයකට වලංගුව පවත්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය මෙයින් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

"අතුරු ව්‍යවස්ථා, නියෝග සහ රීති.

46 (1) (අ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දී ඇති කාරණා සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලයේ පාලක සභාව විසින් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබිය හැකි ය.

(ආ) විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් අතුරු ව්‍යවස්ථාවේ කෙටුම් පතක් පිළියෙල කොට විශ්වවිද්‍යාලයේ පාලක සභාව වෙත ඉදිරිපත් කරන ලද්දේ නම් මිස, පාලක සභාව විසින්, විශ්වවිද්‍යාලයේ ඉගැන්වීමට හෝ විභාගවලට හෝ අදාළ නැතහොත් ඒ හා සම්බන්ධ යම් කාරණයක් සම්බන්ධයෙන් කිසිදු අතුරු ව්‍යවස්ථාවක් නොසෑදිය යුතු ය.

(ඇ) පාලක සභාව විසින් සාදනු ලබන සෑම අතුරු ව්‍යවස්ථාවක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතු වන අතර, එහි නිශ්චිතව සඳහන් දිනයක සිට එය බලාත්මක වන්නේ ය.

(2) නියෝග සෑදීමට බලය දී ඇති යම් කාරණයක් සම්බන්ධයෙන් අවශ්‍යාවෝචිත පරිදි, පාලක සභාව විසින් හෝ විශ්වවිද්‍යාලයේ සනාතන සභාව විසින් හෝ නියෝග සාදනු ලැබිය හැකි ය.

(3) විශ්වවිද්‍යාලයේ යම් බලමණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් හෝ විසින් පහත දැක්වෙන කාරණා සම්බන්ධයේ රීති සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනතේ හෝ යම් උචිත සාධන පත්‍රයක හෝ විධිවිධාන යටතේ, රීති මගින් නියම කළ යුතු හෝ නියම කළ හැකි සියලු කාරණා ;

(ආ) රීති සෑදීමට මේ පනතේ හෝ, යම් උචිත සාධන පත්‍රයක හෝ විධිවිධාන යටතේ නියම කොට ඇති හෝ බලය පැවරී ඇති සියලු කාරණා ;

(ඇ) හුදෙක්ම යම් බලමණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට අදාළ වන්නා වූ ද මේ පනතින් හෝ යම් උචිත සාධන පත්‍රයකින් විධිවිධාන සලස්වා නොමැත්තා වූ ද සෙසු සියලු කාරණා තවද

(ඈ) යම් බලමණ්ඩලයක් හෝ වෙනත් මණ්ඩලයක් විසින් සාදනු ලැබූ යම් රීතියක් ඒ බලමණ්ඩලය හෝ ඒ වෙනත් මණ්ඩලය හෝ විසින් සාදනු ලබන එවැනිම රීතියකින් සංශෝධනය කිරීම, එයට යමක් එකතු කිරීම, එය වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම හෝ කළ හැකි ය.".

"මහා මහෝපාධ්‍යායයන් වහන්සේ" යන යෙදුම.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ "මහා මහෝපාධ්‍යායයන් වහන්සේ" යන වචන යෙදෙන කවර හෝ තැනෙක ඒ වෙනුවට "මහා මහෝපාධ්‍යායයන් වහන්සේ" යන යෙදුම ආදේශ කරනු ලැබිය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ප්‍රතිස්ථාපනය කිරීම.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 48 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :—

අර්ථ නිරූපණය

48. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ—

"ආචාර්යවරයා" යන්නෙන්, මහාචාර්යවරයෙක්, සහාය මහාචාර්යවරයෙක්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙක්, කථිකාචාර්යවරයෙක්, සහකාර කථිකාචාර්යවරයෙක්, පුස්තකාලයාධිකාරිවරයෙක්, නියෝජ්‍ය පුස්තකාලයාධිකාරිවරයෙක්, ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිකාරිවරයෙක් සහ සහකාර පුස්තකාලයාධිකාරිවරයෙක් අදහස් වේ ;

"උචිත සාධන පත්‍රය" යන්නෙන්, මේ පනතේ විධිවිධානවලට අනුකූලව සාදනු ලැබූ යම් නියමයක්, අනුරූ ව්‍යවස්ථාවක්, නියෝගයක් හෝ රීතියක් අදහස් වේ ;

"ලේකම්වරයා" යන්නෙන්, උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය ඉවත් කිරීම.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලැබේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

28. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

පාර්ලිමේන්තුවේ ශ්‍රී ලංකා පනත් සංග්‍රහයේ සහ පනත් වල වාර්ෂික දායක මුදල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් අධිකාරි ගෙවීම් කළ වර්ෂයකට දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර මුදල් ගෙවා [illegible] හැකිය.